# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 447/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 14/03/2024<br>පැය 1050 | | |

# මාධ්‍ය නිවේදනය

## 01. හෙරොයින් සමග සැකකරුවකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.

2024.03.13 වන දින උදෑසන කාලයේදී මෝදර පොලිස් වසමේ බෝගහ හන්දිය ප්‍රදේශයේදී මෝදර පොලිස් ස්ථානයේ නිළධාරීන් විසින් වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 502 මිලිග්‍රෑම් 315 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකරුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීම් වලදී අනාවරණය වු තොරතුරු මත වත්තල ප්‍රදේශයේ පිහිටි නිවසක තිබී **හෙරොයින් කිලෝ 01 ග්‍රෑම් 39 ක්, කේරළ ගංජා කිලෝ 07 ග්‍රෑම් 330 ක්, මත්පෙති නිෂ්පාදනය කිරීමට යොදා ගනු ලබන බව සැකකරන හඳුනා නොගත් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 950 ක්, විද්‍යුත් තරාදියක් ඇතුළු** දේපළ පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - කොළොන්න පොලිස් වසම.

2024.03.14 වන දින අළුයම් කාලයේ කොළොන්න පොලිස් වසමේ ඇඹිලිපිටිය සූරියකන්ද මාර්ගයේ මඩුවන්වල ප්‍රදේශයේදී පුද්ගලයෙකු තුවාල සහිතව වැටී සිටින බවට කොළොන්න පොලිස් ස්ථානයට තොරතුරක් ලැබී ඇත. පොලිසිය විසින් එම පුද්ගලයාව කොළොන්න රෝහල වෙත ඇතුළත් කර ඇති අතර තුවාලකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා ඇඹිලිපිටිය රෝහල වෙත මාරුකර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක්වූ මඩුවන්වෙල, කොළොන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැඩිදුර විමර්ශනයේදී මෙම පුද්ගලයා කාර් රථයක ගැටී අනතුරකට ලක්ව ඇති බවට අනාවරණය වී ඇත. අනතුරට වගකිවයුතු කාර් රථයේ රියදුරු එම අවස්ථාවේ පලාගොස් තිබූ අතර සැකකරු පසුව පොලිස් ස්ථානයට පැමිණ

භාරවීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත. කොළොන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**